// The emblem is a logo, not added.
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2086/22 - 2018 අගෝස්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

3 වන සංශෝධනය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව

අංක 1842/2 හා 2013 දෙසැම්බර් 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ අංක 1923/47 හා 2015 ජූලි 16 දිනැති සහ අංක 1979/33 හා 2016.08.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර මඟින් සංශෝධිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අංක අමප/17/2814/702/067-I හා 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පහත දැක්වෙන ආකාරයට සංශෝධනය විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 අගෝස්තු මස 20 වැනි දින.

ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 13.3 ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

13.3 සේවයේ පළමුවන (I) ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

13.3 (අ) සපුරා තිබිය යුතු අවශ්‍යතා

(i) එලෙසම පවතිනු ඇත.

(ii) උසස් කිරීමේ දිනට සේවයේ පළමුවන (I) ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු (I) ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම

(iii) උසස් කිරීමේ දිනට සේවයේ වසර දහඅට (18) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

1A - G 28387 — 08 (2018/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(iv) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව **උසස් කිරීමේ දිනට** පූර්වාසන්න වසර පහ (05) තුල වාර්ෂික කාර්ය සාධනය සතුටුදයක හෝ ඉහළ මට්ටමක පැවතීම.

(v) **උසස් කිරීමේ දිනට** පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදයක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

(vi) III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිය දිනට සම්පූර්ණ කර තිබීම.

13.3 (*ආ*) උසස් කිරීමේ ක්‍රමය

එලෙසම පවතිනු ඇත.

09 - 337

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.